පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂයඃ- පෙරදිග සංගීතය

ජූලි සතියඃ- 04

ශ්‍රේණිය ඃ- 10

Prepared by- Ravi Kurulugama
(Music Teacher:- Ke/Dehi/Waharaka M.M.V.

**නිපුණතාවය 4.0 ඃ- දේශිය සංගීතය පිළිබඳව ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික අරුමය රැක ගනියිග**

**නිපුනතා මට්ටම 4.1ඃ- ඃ- ජනගී වර්ග කරමින් එක් එක් වර්ගයට අයත් ගීත පිළිබඳ ප්‍රායෝගිකව අධ්‍යනය කරයි.**

- ❖ ආසාතාත්මක බැති ගී හා කෙළි ගී
  - ○ තාලය හොවත් ආසාතය තබමින් මාත්‍රා විභාග අනුව බෙදා වෙන්කළ හැකි ගී ආසාතාත්මක ගැමි ගී වේ
    - ▪ තුණ්සරණේ ගී
  - ○ ඇදහිල් ගී යටතට තුන්සරණේ ගීත අයත් වේ
  - ○ ශ්‍රි පාදය හා වන්දනා ගමන් වලදී සාමුහිකව ගායනා කළ ගීත විශේෂයක් ලෙස තුන්සරණේ ගීත හැදින්වේ
  - ○ බෞද්ධ ආගමට අනුව ත්‍රිවිද රත්නයේ ආශීර්වාදය පතා මෙම ගීත ගායනා කර තිබේ.
  - ○ මේ සඳහා ශුද්ධ ස්වර ඇතුලත් නාද මාලා මෙන් ම කෝමළ ස්වර ඇතුලත් නාද මාල දෙකක් භාවිතා කර තිබේ.
  - ○ පහත් ගීත හා නාද මාලා අධ්‍යනය කරන්න
    - ○

සරණයි සරණයි බුද්ධං සරණයි
සරණයි සරණයි ධම්මං සරණයි
සරණයි සරණයි සංඝං සරණයි
සරණයි සරණයි මේ තුන් සරණයි

ස්වර ප්‍රස්තාරය (ශුද්ධ ස්වර පමණයි) සරණයි සරණයි බුද්ධං ස

| නිනිස | රිගග | රිස රිස රිග | රිස - |
| නිනිස | රිගග | රිස රිස රිග | රිස - |

පාද 4 ම මෙම නාදමාලාවට ගැයේ.
බුද්ධං සරණේ සිරස දරාගෙන - ශුද්ධ ස්වර පමණක් යෙදේ.

| ධසස | රිගරි | ගම- | ගරිසරි |
| ගමග | රිරිග | සරිසගරි | ස- |

පාද 4 ම මෙම නාදමාලාවට ගැයේ.

කෝමල ස්වර යෙදෙන නාදමාලාවත්.

අලුයම බුද්ධං සරණේ ගඤ්ඤයි
මද්දිම ධම්මං සරණේ ගඤ්ඤයි
සවසට සංඝං සරණේ ගඤ්ඤයි
තුන් යමට ම තුන් සරණේ ගඤ්ඤයි

| නිනිස | රි ග- | රි ග රි | ස-- |
| නිනිස | රි ග රි | රි ග රි | ස-- |

පාද 4 ම මෙම නාදමාලාවට ගැයේ. 57/70

- ▪ කෙළි ගී
  - ○ ගැමි ගී වර්ගීකරණය යටතේ සමාජ ගී යටතට කෙළි ගී අයත් නේ
  - ○ ජන ක්‍රීඩා හා සම්බන්ධ ගී කො ගී වේ
  - ○ සාමුහිකව විනෝදාස්වාදය කණ්ඩායම් හැගීම හා ඇතිව ජන ක්‍රීඩා වල යෙදීමේදී මෙම ගී ගායනා කරයි

ඔලිඳ කෙලිය

| | | | |
|---|---|---|---|
| ධසස | සසරි | ග-- | මගරිසරි- |
| ඔලිඳ | තිබෙන් | නේss | ss ss ss |
| ගමග | රිරිග | රිස- | - - - |
| කොයිකො | යිදේs | සේss | s s s |
| සප- | පධප | ම-- | ගරිසරි- |
| ගෙනත් | සදන් | නේss | ss ss s |
| ගමග | රිරිග | රිස- | --- |
| කොයිකො | යිදේs | සේss | s s s |

- *__ක්‍රියාකාරකමඃ-__*

01- තුණ්සරණේ ගී ත හා ඔලිඳ කොළියේ ගී ඇතුලත් පොතක් සකස් කරන්න.
02- ඉහත කරුණු පොතෙහි සටහන් කර ගන්න
03- ආසාතාත්මක ගැමි ගී පිළිබද නිර්වචනයක ලියන්න
04- ඉහත ගැමිගී ශ්‍රවණය කිරීමට හා පසුව ගායනයට පුහුණු වන්න

❖ අන්තරජාලයේ මේ සම්බන්ද ඇති පාඩම් වැඩිදුරට අධ්‍යනය කැන්න.

(ඒ සඳහා ඊ නැණපියස, ඊ තක්ෂලා, යූටියුබ්, වැනි වෙබ් අඩවි භාවිතා කළ හැකිය) ඔබට අවශ්‍ය ස්වර ප්‍රස්ථාර ලබා ගැනීමට “ ඊ නාද” APPS ඔබගේ ජංගම දුරකථනයට ඇතුළු කර ගන්න.